*Vidyodaya J. Arts, Sci., Lett., Silver Jubilee, pp.* 253-259

# බුදුපිළිමවල හිසමුදුනේ ඇති සංකේතය හැඳින ගැනීම


**චන්ද්‍රා වික්‍රමගමගේ**

විවිධ බෞද්ධ සම්ප්‍රදයන්ට අයත් බුදු පිළිමවලින් ඉතා සුළු ප්‍රමාණයක් හැර ඉතිරි බුදු පිළිමවල හිස මුදුනේ කිසියම් සංකේතයක් දක්නට ලැබේ. එම සංකේතය සහිත බුදු පිළිම ප්‍රධාන වශයෙන් වර්ග දෙකකට අයත්ය. හිස් කබල මුදුනේ අස්ථිමය හෝ මාංශමය උන්නතස්ථානයක් සහිත බුදු පිළිම එයින් එක් වර්ගයකි. හිසමුදුනේ ශිඛාකාර කෙස් සැරසිල්ලක් හෝ ශිඛාකාර බාහිර සංකේතයක් සහිත බුදු පිළිම අනිත් වර්ගයයි. එයින් දක්වෙන්නේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණවලින් එකක් වන උණ්හීසසීස (සංස්කෘත උෂ්ණීෂශීර්ෂ) ලක්ෂණය බව මෙතෙක් මේ පිළිබඳව පයෙෂණ පැවැත්වූ පඬිවරුන්ගේ මතයයි. එය කෙස්දරණුවක්ද මාංශමය හෝ අස්ථිමය උන්නතස්ථානයක්ද යන්න ගැන ඔවුන් අතර එකඟත්වයක් නැත.

ආදිම ගන්ධාර බුදු පිළිමවල හිසමුදුනේ කෙස් ගැටයක සේ තනා ඇති බවත් ආදි මථුරා බුදු පිළිමවල හිස මුදුනේ ගොළුබෙල්ලෙකුගේ හැඩයෙන් පිළියෙළ කරන ලද කෙස් දරණුවක් ඇති බවත් කියන ආනන්ද කුමාරස්වාමි එය දෙතිස්මහා පුරුෂ ලක්ෂණ වලින් එකක් වන උණ්හීසසීස (උෂ්ණීෂශීර්ෂ) ලක්ෂණය ලෙස හඳුනාගෙන තිබේ.[1] ජේ. එන්. බැනර්ජි[2]+පැන් ලොහයිසන්[3], ජේ. පී. එච්.+ඩූගල්[4] හා එස් ක්‍රම්රිස්ච් ද[5] මීට සමාන මත දරති. ක්‍රි.ව. 2 හෝ 3 සියවසට අයත් ගණ්ඩව්‍යූහයෙහි උෂ්ණීෂය හිස මුදුනේ මැද වූ කෙශාභරණයකි-.[6] සමහර ගන්ධාර බුදු පිළිමවල එවැනි කෙශාභරණයක් (ශිඛාකාර කෙස් සැරසිල්ලක්) දක්නට ලැබේ. මෙයින් පෙනෙන්නේ ඉහත සඳහන් පඬිවරුන් පමණක් නොව ගණ්ඩව්‍යූහය හා සම්බන්ධ වූ ද ශිඛාකාර කෙස් සැරසිල්ල සහිත ගන්ධාර බුදු පිළිම හා සම්බන්ධ වූ ද බෞද්ධ සම්ප්‍රදයක් ක්‍රි.ව. 2 හෝ 3 සියවස සිට පැවති බවයි.

ගණ්ඩව්‍යූහයෙහි දක්වෙන අර්ථකථනයට ආනන්ද කුමාරස්වාමි ඇතුළු පඬිවරුන් දක්වා ඇති මතය එකඟ වන බව පෙනේ. එහෙත් එය වඩාත් පැරණි යයි සැලකිය හැකි ශ්‍රී ලංකාවේ පාළි බෞද්ධ සම්ප්‍රදය සමග ගැටේ. බුදුන් වහන්සේ මුළු ජීවිත කාලයේම අඟල් දෙකකට නොවැඩි හා නොඅඩු කෙස් දරූ බවත් ඒ කෙස් දක්ෂිණාවර්ත කෙස්පිඩු වශයෙන් හිසට ඇලී පැවති බවත් බුද්ධවංස අට්ඨකථාවෙහි[7] හා ජාතකනිදානකථාවෙහි[8] සඳහන් වෙයි. මේ අදහස අට්ඨකථා යුගයට වඩා පැරණිය. දෙවැනි සංගායනාවත් තුන්වැනි සංගායනාවත් අතර කාලයට අයත් සේ සැලකෙන චුල්ලවග්ගයේ දැඟලක් දිග කෙස් දැරීමටත් ඊට වඩා දිගට වැඩුනු කෙස් නොදැරීමටත් භික්ෂූන්ට නියම කර තිබේ[9]. බුදුන් වහන්සේද මේ නියමය අනුගමනය කළාට සැකයක් නැත.

සිද්ධාර්ථ කුමාරයා පැවිදි වූ අවස්ථාවේ දැඟලක් දිගට ඉතිරි වනසේ කෙස් කපා දැමූ බවත් ඊට පසු කවදවත් දැඟලකට වඩා කෙස් දික් නොවූ හෙයින් නැවත කෙස් කැපීමක් අවශ්‍ය නොවූ බවත් ජාතක නිදනයෙහි වැඩිදුරටත් සඳහන් වෙයි.[10] අඟල් දෙකක් දිග එහෙත් ආවර්ත කෙස් හිසමුදුනේ ගැටයක් (කොණ්ඩයක්) මෙන් දක්වීමට ප්‍රමාණවත් නොවේ. එමෙන්ම කත්‍රා බුදු පිළිමය වැනි හිස මුඩුකළ බුදු පිළිමයක හිස මුදුනේ පමණක් කෙස් දරණුවක් තැනීමට ප්‍රමාණවත් දිග කෙස් දක්වීමද අනුචිතය. මේ නිසා බුදුන් වහන්සේගේ හිස මුදුනේ කෙස් ගැටයක් හෝ කෙස්දරණුවක් තිබුණාය යන මතය පාළි බෞද්ධ සම්ප්‍රදයට පටහැනිය.



දූදිගම කොට වෙහෙරෙන් ලැබුණ සිඛාකාර සිරස්පත සහිත බුදු පිළිමයක්

ඉහත සඳහන් අර්ථකථනයට වෙනස්ව ලලිතවිස්තරයේ දෙවන සංස්කරණය වශයෙන් චීනයේ ප්‍රසිද්ධ කෘතියේ උෂ්ණීෂය හිස මුදුනේ ඇති මාංශමය නෙරීමකි.[11] මේ කෘතිය ක්‍රි.ව. 3 වැනි සියවසට අයත් සේ සලකනු ලැබේ. උෂ්ණීෂ යන්නට දී ඇති චීන පරිවර්තනද මෙහිලා වැදගත් වෙයි. මුදුන් ඇටය, මාංශමය මුදුන් ගැටයේ ඇටය, දෙවියන්ගේ හිරවරණ බඳු උෂ්ණීෂය එවැනි පරිවර්තන වලින් කීපයක අර්ථ වෙයි.[12] ජපානයේ **නික්කෙයි** යන්නෙන් හඳුන්වනු ලබන්නේ උෂ්ණීෂයයි. ඉන් අදහස් වන්නේ හිසමුදුනේ මාංශමය උන්නතස්ථානයකි.[13] පසුකාලීන ශිල්පශාස්ත්‍ර ග්‍රන්ථවලද උෂ්ණීෂය හිසමුදුනේ ඇති ලක්ෂණයක් ලෙස දක්වා තිබේ.[14] මේ සාධකවලින් පෙනීයන්නේ උෂ්ණීෂය හිසමුදුනේ කෙස් සැරසිල්ලක් නොව මාංශමය හෝ අස්ථිමය උන්නතස්ථානයක් බවයි. පාහියන් හිමි බුදුන් වහන්සේගේ උෂ්ණීෂය දැක තිබේ. එය කපිස්ථානයේ ආරාමයක තැන්පත් කර තිබී පසුව ගන්ධාරයට ගෙනයන ලදී කහ පාටට හුරු සුදු පැහැයෙන් යුත් එය හරහට අඟල් දෙකක් පමණ වූ බවත් මැදින් උස්ව තිබූ බවත් උන්වහන්සේ වැඩි දුරටත් කියති.[15] පාහියන් හිමිට පසුව ගන්ධාරයට ගිය හ්‍යූන් තිසාන් හිමිද එය දැක තිබේ. උන් වහන්සේ විස්තර කරන පරිදි එය බුදුන් වහන්සේගේ හිස මුදුණේ ඇටයයි.[16] ජෛන ලේඛකයෙකු වූ අභය දේව ශූරිගේ අර්ථකථනයට අනුව උෂ්ණීෂය හිස මුදුනේ ඇති පාෂාණ පිණ්ඩිකාවකි.[17]

ආර්. පී. චන්ද උෂ්ණීෂ ශීර්ෂ යන්නෙන් තලප්පාව (turban) වැනි හිස අදහස් වේ යයි කියයි. එය විස්තර කරන ඔහු උෂ්ණීෂ ශිඛාවක් හිස මුදුනේ දැක්වීමෙන් හිස උෂ්ණීෂයක් මෙන් පෙනේයයි කියයි.[18] බුදු පිළිම තැනීමේදී එසේ හිස මුදුනේ උෂ්ණීෂ (තලප්පා) ශිඛාවක් දැක්විය හැකිය. මහාපුරුෂ ලක්ෂණයක් වශයෙන් එය ගෞතම බුදුන් වහන්සේගේ හිසේ පිහිටා තිබුණේද යන්න සැක සහිතයි.

බුද්ධඝොෂ හිමි බුදුන්වහන්සේගේ උණ්හීසසීස ලක්ෂණය විස්තර කරන්නේ ඉහත සඳහන් අර්ථකථන වලට හාත්පසින්ම වෙනස් ලෙසිනි. පිරිපුන් හිස (පරිපුණ්ණසීස) හා පිරිපුන් නළල ඉන් අදහස් වන බව උන්වහන්සේ පෙන්වා දෙයි. බුදුන් වහන්සේගේ හිස දිය බුබුලක් මෙන් රවුම් බවත් තලප්පාවක් මෙන් පරිමණ්ඩලාකාර බවත් එක් කන්සිළුවක සිට නළල හරහා දිවෙන මාංශ පටලයකින් බුදුන් වහන්සේගේ නළල පිරිපුන් බවත් එය නළල්පටක් බැඳි කලෙක මෙන් පෙනෙන බවත් වැඩිදුරටත් උන්වහන්සේ පෙන්වාදෙති.[19] මෙම අර්ථකථනය මහාවිහාර අර්ථකථන සම්ප්‍රදයට අයත් වූවක් බවට සැකයක් නැත. මහාපුරුෂයාගේ හිස ඡත්‍රාකාර බව මහාභාරතයේ සඳහන් වෙයි.[20] එනිසා උන්හීසසීස (උෂ්ණීෂ ශීර්ෂ) යන්න අර්ථ වශයෙන් ඡත්‍රාකාර ශිරඃ යන්නට සමාන වෙයි. හේමචන්ද්‍ර ශූරිගේ ත්‍රිෂෂ්ටිසලාකා පුරුෂ චරිතයෙහි වෘෂභදෙව තුමාට ශීර්ෂච්ඡත්‍රයක් (ඡත්‍රාකාර හිසක්) තිබුණ බව සඳහන් වෙයි.[21] ඉන් අදහස් වන්නේ හිසේ පිහිටීම මිස හිසමුදුනේ උන්නතස්ථානයක් හෝ කෙස් සැරසිල්ලක් හෝ බාහිර වශයෙන් හිස මුදුනේ සවිකරන ලද්දක් නොවේ.

තිබ්බතීය බෞද්ධයන් උෂ්ණීෂය වටහාගෙන ඇත්තේ සහ බුදු පිළිමවල දක්වා ඇත්තේ හිස මුදුනේ සහස්‍රාකාර චක්‍රය මත ඇති ශිඛාව ලෙසිනි.[22] ලලිත විස්තරයේ තිබ්බතීය අනුවාදයෙහි එන පරිදි බුදුන් වහන්සේගේ හිස මුදුනෙහි ශිඛාකාර උන්නතස්ථානයක් වෙයි. එයින් පූර්ව බුද්ධානු පස්මෘත්‍යසංගඥානය සංකේතවත් වෙයි.[23]

පාලි උණ්හීස සංස්කෘත උෂ්ණීෂ යන්නේ ප්‍රාකෘත රූපයයි.[24] වෛදික ආර්‍ය්‍යයන් ස්ත්‍රී පුරුෂ භේදයෙන් තොරව උෂ්ණීෂයක් හෙවත් හිස්වෙළුමක් පැළඳි බවටත් සාධක

තිබේ.[25] රාජසූය යාගයේදී රජු ඔහුට විශේෂ වූ උෂ්ණීෂයක් පැලඳ සිටිය යුතුවිය.[26] එය ඔහුගේ රාජ්‍යත්වය හඟවන්නකි. ශතපථ බ්‍රාහ්මණයෙහි එන උෂ්ණීෂ යන්නෙන් හිසවටා දවටන රෙදි පටියක් අදහස් විය හැකැයි ඇම්. බී. ආරියපාල කියයි.[27] සංකිච්ච-ජාතකයෙහි උෂ්ණීෂය පංචකකුධ භාණ්ඩ වලින් එකකි.[28] ක්‍රි.පූ. 3 සියවසදී ධර්මාශෝක රජු ලංකාවේ දෙවානම්පිය තිස්ස රජුගේ අභිෂේකය සඳහා එවූ භාණ්ඩ අතර උෂ්ණීෂය සහිත පංචකකුධ භාණ්ඩ විය.[29]. ක්‍රි.පූ. 1 වැනි සියවසට පමණ අයත් මිලින්දපඤ්හයේ පංචකකුධභාණ්ඩ අතරද උෂ්ණීෂය සඳහන් වෙයි[30]. වංසත්ථප්පකාසිනියෙහි උෂ්ණීෂය විස්තර කර ඇත්තේ නළල්පට වශයෙනි.[31] ''උණ්හීස නම් නළල්පටයි'' යනුවෙන් ජාතකඅටුවා ගැටපදයෙහි සඳහන් වෙයි.[32] නළල් ඇටයටද උණ්හීස යන්න යෙදේ. බුදුන් වහන්සේගේ නොවිසුරුණ සප්ත ධාතූන් අතර උණ්හීසය හෙවත් නළල් ඇටයද විය. එය නිසැකවම ලලාටධාතුවයි.[33] හිස්වෙළුම, නළල් පටිය, නළල් ඇටය යන අර්ථ සඳහා උණ්හීස යන්න යෙදෙන බව මෙයින් පෙනේ.

උණ්හිසසීස (උෂ්ණීෂශීර්ෂ) යන්නට දී ඇති විවිධ අර්ථකථන ගැන මෙතෙක් අපි සාකච්ඡා කෙළෙමු. බුද්ධඝොෂ හිමියන් ඉදිරිපත් කරන මහාවිහාර අර්ථකථනයට අනුව හිසේ හා නළලේ පිහිටීම මිස හිසමුදුනේ ඇති අස්වාභාවික ලක්ෂණයක් උණ්හීසය ලෙස සැලකිය නොහැකිය. එහෙත් මෙහි දක්වූ අනෙක් අර්ථකථන ඊට පටහැනිව හිස මත ඇති කෙස් සැරසිල්ල හෝ මාංශමය නෙරීම හෝ අස්ථිමය නෙරීම උෂ්ණීෂය ලෙස ගෙන තිබේ.

පුණ්‍යප්‍රභාවෙන් හටගෙන මුළු ශරීරය පුරා විහිදී ඇති අසීත්‍යනුව්‍යඤ්ජන, දෙතිස් මහා පුරුෂ ලක්ෂණ, රංසිජාලය, ෂඩ්වර්ණ ප්‍රභාමණ්ඩලය, නොයෙක් වර්ණයෙන් යුත් කෙතුමාලාව බුද්ධරූපයේ මූලික ලක්ෂණයෝය.[34] කේතුමාලාව විස්තර කරන සමන්තපාසාදිකාව නන් පැහැයෙන් යුත් විමල කේතුමාලාවකින් බබලන හිසක් (නානාවිරාග විමල කෙතුම්මාලාසමුජ්ජලමත්ථක) බුදුන් වහන්සේට තිබුණු බව කියයි.[35] හිසින් නික්ම හිසමුදුනට උඩින් ඇති රංසිපුඤ්ජය කේතුමාලාව බව වංසත්ථප්පකාසිනිය කියයි[36]. සාරත්ථදීපනියෙහිද මේ අදහස දක්වා තිබේ.[37] හිසමුදුනේ මැද පෙනෙන උන්නතස්ථානය කේතුමාලාව බවට මතයක් පැවති බවද සාරත්ථදීපනිය පෙන්වා දෙයි[38]. වංසත්ථප්පකාසිනීකරුද ඒ ගැන සඳහන්කර එය කෙවිවාදයක් ලෙස හඳුන්වා දෙයි.[39] 'කෙචි' යන්න අභයගිරිවාසීන් සඳහා විසුද්ධි-මග්ගයෙහි යෙදේ.[40] මෙහි ද එය එම අර්ථයෙන් යොදන්නට ඇති බවට අභයගිරි විහාර භූමියේ ඇති බුදුපිළිමවල හිසමුදුනේ මැද එසේ උන්නතස්ථානය දක්වා තිබීමෙන් වටහාගත හැකිය. පූජාවලියෙහි[41] කේතුමාලාව දක්වා ඇත්තේ ''ශිරො-ධාතුවෙන් වඩුරියනක් නැගී හැම වේලෙහිම ජ්‍යොතිමත්ව තිබෙන්නාවූ කෙතුමාලා නම් රශ්මි කදම්බයයි'' යනුවෙනි. මේ සාධකවලින් ඔප්පු වන්නේ කේතුමාලාව මහා-පුරුෂ ලක්ෂණයක් නොව බුදුපිළිම හිස මුදුනේ දෙව්ධියකින් දක්වා ඇති බවයි. මහා-විහාර සම්ප්‍රදය පිළිගෙන ඇති අන්දමට එය හිස මුදුනේ ඉහළින් දැකවෙන සංකේත-යකි. අභයගිරිවාසීන්ට අනුව එය හිසමුදුනේ මැද ඇති උන්නතස්ථානයයි. අන්තිමට කී කේතුමාලා සංකේතය මහායාන බුදු පිළිමවලද කැපී පෙනෙන ලක්ෂණයකි. එහෙත්



හිස මුදුනේ උන්නත කොටස සහිත ගන්ධාර බුදු පිළිමයක්

ඔවුහු එය උෂ්ණීෂය ලෙස හඳුන්වති. මහායාන ආභාෂය ලැබූ අභයගිරි විහාරවාසී භික්ෂූන් වහන්සේලාද එම සංකේතය භාරගෙන ඇතද එය උෂ්ණීෂය ලෙස නොව කේතුමාලාව ලෙස පිළිගෙන තිබූ බව පෙනේ. මහනුවර යුගයේ පමණ සිට එය සිරස්පත නමින් හඳුන්වනු ලැබේ.

මහායාන බෞද්ධ සම්ප්‍රදයට අනුව බුදු පිළිමවල හිස මුදුනේ ඇති සංකේතය දෙතිස් මහා පුරුෂ ලක්ෂණ වලින් එකක් වන උණ්හීසසීය ලක්ෂණයයි. සිංහල බුද්ධාගමට අනුව එය මහා පුරුෂ ලක්ෂණවලින් පරිබාහිර වූ හිසින් නික්මෙන බුද්ධ රශ්මිය සංකේතවත් කරන කේතුමාලාවයි.

## NOTES

1. "The Buddha's Hair and Usṇisa and crown," *Journal of Royal Asiatic Society*, 1928.
2. "Usnisasiraskatā (a mahāpurusalaksaṇa) in the early Buddha images of India," *Indian Historical Quarterly*, Vol. II, No. 3, pp. 510–12.
3. *The Sythean Period*, Leiden 1947, p. 20.
4. *Buddhist Art in India, Ceylon and Java*, Oxford 1936, pp. 22ff.
5. Emblems of the Universal Being."*Journal of Indian Society of Oriental Art*, Vol, 3, 1935 pp. 148, 160; 'Note on Usṇisa," එම 1936, pp. 79–83.
6. *The Suvarūaprabhāsasūtra*, edited by Nanjio and Hokei, p. 28.
7. බුද්ධවංශ අට්ඨකථා, යගිරල පඤ්ඤානන්ද සංස්කරණය, කොළඹ 192, 235, පිට,
8. *Jataka*, edited by V. Fausboll, Vol. I, London 1962, p. 64.
9. *Cullavagga*, edited by T. W. Rhys Davids and H. Oldenberg, The Sacred Books of the East. Oxford 1885, p. 69.
10. අධොලිපි අංක 8 බලන්න
11. S. Beal, *The Fo Suo hsang tsan Ching*, Sacred Books of the East, XIX, Oxford 1883, p. 359 n. 11.
12. Etel's *Hand Book of Chinese Buddhism*, Second edition, p. 182.
13. *Japanese English Dictionary* by Shuppansha, 1965, p. 219.
14. *Encyclopaedia of Hindu Architecture*, edited by P. K. Acarya, Calcutta 1927.
15. *Fa-Hian*, S. Beal's Records, I, XXIV.
16. *Hiun Tsan*, S. Beal's Records, I, p. 96.
17. *Aupapātika sūtra*, 10, Arranged and commented upon by Abhayadevasuri and corrected by Dronacarya, Bombay 1916.
18. "The Hair and the Usṇisa on the Head of the Buddhas and Jinas." *Indian Historical Quarterly*, Vol VII, No. 3 pp. 671–72.
19. දීඝනිකායට්ඨකථා (හේවාවිතාරණ මුද්‍රණය) I, 1918, 304 පිට;
මජ්ඣිමනිකායට්ඨකථා, (හේවාවිතාරණ සංස්කරණය) III, 1947 265–66 පිටු
20. *Mahābhārata*, XII, 343–38.
21. *Trisasṭisalākāpurusacarita*, I, 2, 686–734; M. M. Johnson's translation, Baroda 1931, Vol. I, p. 137.
22. Blanche Christine Olschak in Collaboration with Geshe Thupten Wangyal, *Mystic Art of Ancient Tibet*, George Allen and Unwin, London 1975, p. 20.
23. L. A. Waddell, *Buddhism in Tibet*, p. 318.
24. *Summary of Mānasāra, by P. K. Acarya*, p. 42.
25. *Atharvaveda* XV. 2. 1.
26. *Vedic index of names and subjects*, edited by A. Macdonel, Varanasi 1958, Vol. I, p. 104.
27. මධ්‍යකාලීන ලංකා සමාජය, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ පරිවර්තනය, 1962, 359 පිට.
28. *Jataka*, edited by V. Fausboll, Vol. V. p. 264.
29. මහාවංශ, 11. 28.
30. *Milindapanho*, edited by Trenkner, (PTS), London 1962, p. 330.
31. *Vaṃsatthappakāsini*, edited by G. P. Malalasekera, (PTS), Vol. I, Oxford 1935, p. 304.
32. ජාතක අටුවා, ගැටපදය, ඩී. බී. හෙට්ටිආරච්චි සංස්කරණය කොළඹ 1950, 116 පිට.
33. ලොමධාතු වංශය බලන්න.
34. සමන්තපාසාදිකා (හේවාවිතාරණ මුද්‍රණය) I, 1929, 25 පිට.
විමානවත්ථු අට්ඨකථා (හේවාවිතාරණ මුද්‍රණය) 1925, 260 පිට.
35. සමන්තපාසාදිකා (හේවාවිතාරණ මුද්‍රණය) I, 1929, 25 පිට.
36. *Vaṃsatthappakāsini*, p. 304.
37. සාරත්ථප්පකාසිනී, දෙවරක්ඛිත සංස්කරණය, 1914, 105 පිට,
38. එම
39. *Vaṃsatthappakāsini*. p. 304.
40. විසුද්ධිමග්ග ටීකා, මොරොන්තුඩුවේ ධම්මානන්ද සංස්කරණය, 1928, 103 පිට.
41. පූජාවලිය, බෙන්තර සද්ධාතිස්ස සංස්කරණය, පානදුර 1930, 139 පිට: